049

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනපති උපාධි වැඩසටහන -2023/2024
අවසාන පරීක්ෂණය - 2024
**STP9619 - අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය**
කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2024.08.21 වේලාව : පෙ.ව. 09.30 - ප.ව.12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

01. (i.) උදාහරණ තුනක් (03) දක්වමින් උපදේශනයේ අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 09)

(ii.) අධ්‍යාපනික උපදේශනය මඟින් සිසුන්ගේ අධ්‍යයන කාර්යසාධනය සහ යාවජීව ඉගෙනුම් කුසලතා (lifelong learning skills) වැඩි දියුණු කළ හැකි ආකාරය කරුණු හතරක් (04) දක්වමින් අගයන්න. (ලකුණු 08)

(iii.) හොඳ උපදේශකවරයෙකු වීමට ගුරුවරයෙකු විසින් සංවර්ධනය කර ගත යුතු ලක්ෂණ හතරක් (04) ඒවායේ වැදගත්කම ඉස්මතු කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

02. (i.) උපදේශකවරුන් ආචාරධර්ම පිළිපැදිය යුත්තේ ඇයිදැයි හේතු තුනක් (03) සපයමින් සාකච්ඡා කරන්න. (ලකුණු 09)

(ii.) සේවාදායකයින් සමඟ ඵලදායි උපදේශන සබඳතා පවත්වා ගැනීම සඳහා උපදේශකවරුන් අනුගමනය කරන ආචාරධර්ම හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) සිසුන්ට උපදේශනය සැපයීමේදී පාසැල් උපදේශකවරයෙකු මුහුණු දෙන ගැටළු දෙකක් (02) පැහැදිලි කර, එම එක් එක් ගැටළුව සඳහා හේතු විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

03. (i.) ප්‍රජානන චර්යාවාදී ප්‍රවේශයේ සහ පුද්ගල කේන්ද්‍රීය ප්‍රවේශයේ මූලික දර්ශනයන්හි වෙනස්කම් දක්වමින් සංසන්දනය කරන්න. (ලකුණු 09)

(ii.) මෙම ප්‍රවේශයන්හි ප්‍රතිකාරාත්මක ක්‍රියාවලිය එකිනෙකින් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) මෙම ප්‍රවේශයන්හි සීමාවන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

04. (i.) ශ්‍රී ලංකාවේ පාසැල්වල ක්‍රියාත්මක වන මාර්ගෝපදේශන සහ උපදේශන වැඩසටහන්වල වර්තමාන තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii.) ශ්‍රී ලංකාවේ පාසැල්වල දැනට පවතින මාර්ගෝපදේශන සහ උපදේශන වැඩසටහන්වල ප්‍රධාන අඩුපාඩු සහ අභියෝග සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) ශ්‍රී ලංකාවේ පාසැල්වල දැනට පවතින මාර්ගෝපදේශන සහ උපදේශන වැඩසටහන්වල ඇති අඩුපාඩු සකස් කිරීමට සහ එම වැඩසටහන්වල ඵලදායිත්වය ඉහළ නැංවීමට උපායමාර්ග **තුනක් (03)** යෝජනා කරන්න. (ලකුණු 09)

05. (i.) පුළුල් සහ ඵලදායී මාර්ගෝපදේශන සහ උපදේශන වැඩසටහනක මූලික ලක්ෂණ **හතරක් (04)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii.) ඔබගේ පාසලේ ද්විතියික සිසුන්ගේ ඔබ හඳුනාගත් **එක් (01)** අවශ්‍යතාවයක් ඉටු කිරීම සඳහා ඉහත සඳහන් කළ ලක්ෂණ ඇතුළත් මාර්ගෝපදේශන සහ උපදේශන වැඩටසහනක් නිර්මාණය කරන්න. (ලකුණු 13)

(iii.) ඉහත වැඩසටහන ඔබගේ පාසලේ ක්‍රියාත්මක වීමේදී ඔබට මුහුණදීමට සිදුවිය හැකි අභියෝග **දෙකක් (02)** සාකච්ඡා කරන්න. (ලකුණු 04)

06. (i.) වෘත්තීය උපදේශනයේ මූලික අංග **හතරක් (04)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii.) ද්විතියික සිසුන්ට තමන්ගේ කුසලතාවයන් සහ වෘත්තීය මාර්ග හඳුනාගැනීමට උපකාර කිරීමට ඔබට භාවිතා කළ හැකි ක්‍රම ශිල්ප **දෙකක් (02)** සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) ඔබගේ පාසලේ සිසුන්ට ලෝකයේ තිබෙන රැකියා අවස්ථා ගවේෂණය කිරීමට උපකාර කිරීමට ඔබට අනුගමනය කළ හැකි උපායමාර්ග **තුනක් (03)** පැහැදිලි කරන්න. (ලකුණු 09)

-හිමිකම් ඇවිරිණි. -